# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2205/18 - 2020 දෙසැම්බර් මස 13 වැනි ඉරිදා - 2020.12.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ**
**පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොටගෙන පූජාපිටිය ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ පූජාපිටිය ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයකු ලෙස පත්වූ ඩී.ජී.එච්. දිල්ෂාන් රූපසිංහ අයත් වන්නා වූ ජනතා විමුක්ති පෙරමුණ නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාලපරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයකු, සභිකයකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම පූජාපිටිය ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ඒ.ඩී. විමුක්ති දාරක එදිරිසිංහ නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී තලංගම අප්පුහාමිලාගේ චමින්ද නාමල් තලංගම වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් ඒ.ඩී. විමුක්ති දාරක එදිරිසිංහ, පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**ටී.ඒ. සී. එන්. තලංගම,**
තේරීම්භාර නිලධාරි,
පූජාපිටිය ප්‍රාදේශීය සභාව.

2020 දෙසැම්බර් මස 08 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මහනුවර.


1A - G 33327— 30 (2020/12)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.